## 1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනත

## 11 වන වගන්තිය යටතේ වූ නියමය

1980 අංක 33 දරන පළිබෝධනාශක පාලනය කිරීමේ පනතේ 11 වන වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්, ජයකොඩි ආරච්චිගේ සුමිත් වන මා විසින්, මහජනයාගේ හිත පිණිස සහ පළිබෝධනාශක තාක්ෂණ හා උපදේශක කමිටුවේ අනුමැතිය මත, මේ නියමය මගින්, ඉහත පනතේ 11 වන වගන්තිය යටතේ සාදන ලද සහ 2014 මාර්තු මස 21 දිනැති අංක 1854/47 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ උපලේඛනය ඉවත් කර ඒ වෙනුවට පහත උපලේඛනය ආදේශ කිරීමෙන්, එම නියමය සංශෝධනය කරනු ලැබේ.

"උපලේඛනය

| සක්‍රීය රස ද්‍රව්‍ය | සාරමය සැපයුම් ලියාපදිංචි අංකය |
|---|---|
| ඇලැක්ලෝර් | 15972-60-8 |
| පැරකොට් | 4685-14-7 |
| ඩයිමෙතොඒට් | 60-51-5 |
| ෆෙන්තියොන් | 55-38-9 |

ආචාර්ය ජේ.ඒ. සුමිත්,
පළිබෝධනාශක රෙජිස්ට්‍රාර්.

පේරාදෙණිය,
2018 සැප්තැම්බර් මස 10 වැනි දින.